දිනමිණ සිළුමිණ The Silumina epaper

# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
# இலங்கை ஏற்றுமதி அபிவிருத்தி சபை
# EDB SRI LANKA EXPORT DEVELOPMENT BOARD

## ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය

## ඇබෑර්තු

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති හැකියාවන් හා වෘත්තීය නිපුණතාවයෙන් හෙබි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## අධ්‍යක්ෂ ජනරාල් තනතුර (HM 2-2)

**රැකියා විස්තරය :**

- සභාපති සහ ප්‍රධාන විධායක විසින් ලිඛිතව සහ අවශ්‍ය විටදී වරින් වර භාර දෙනු ලබන පරිපාලන මූල්‍ය හා මෙහෙයුම් කටයුතු සම්බන්ධ බලතල, කාර්යයන් හෝ රාජකාරි ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම දැරිය යුතුය.
- ඔහු / ඇය පවරන ලද කාර්යයන් හා සම්බන්ධ අන්තර් අමාත්‍යාංශ වැඩ සටහන්වලදී ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමින් අවශ්‍ය විටදී මණ්ඩලය නියෝජනය කිරීම.
- පරිපාලන, මූල්‍ය සහ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් සියලුම අංශ / ඒකකවලට අවශ්‍ය මග පෙන්වීම.
- සභාපති සහ ප්‍රධාන විධායක විසින් පවරා ඇති පරිදි ආයතනයේ සමස්ත පරිපාලන, මූල්‍ය සහ මෙහෙයුම් කටයුතු සඳහා වගකීම දැරිය යුතුය.
- කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන වැඩ සටහන් වැඩි දියුණු කිරීම ඇතුළුව ආයතනයේ එදිනෙදා කළමනාකරණ කටයුතු සඳහා වගකීම දැරිය යුතුය.
- මීට අමතරව, අධ්‍යක්ෂ ජනරාල්වරයා මණ්ඩලයේ ලේකම්වරයා ද වෙයි.

**සුදුසුකම් :**

**(අ) බාහිර අයදුම්කරුවන් සඳහා (පහත i හෝ ii)**

(i) අලෙවිකරණය / ජාත්‍යන්තර සබඳතා / ආර්ථික විද්‍යාව / වානිජ්‍ය / විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය යන විෂයන්ට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක්

**සමග**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (ශාස්ත්‍රපති සුදුසුකම)

**සහ**

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව අවම වශයෙන් වසර 20 ක කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර ඉන් වසර 05 ක් සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක විය යුතුය.

**හෝ**

(ii) අලෙවිකරණය / ජාත්‍යන්තර සබඳතා / ආර්ථික විද්‍යාව / වානිජ්‍ය / විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය යන විෂයන්ට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක්

**සහ**

ඉහත ඕනෑම ක්ෂේත්‍රයකට අදාළව ආචාර්ය උපාධි සුදුසුකම (Ph.D)

**සහ**

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සේවා පළපුරුද්ද තිබිය යුතුය.

**(ආ) අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක (HM 2-1) අවම වශයෙන් වසර 02 ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**සහ**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙහි බලතල, රාජකාරි සහ කාර්යයන් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම හා මානව සහ අනෙකුත් සම්පත් නිසි ලෙස යෙදවීමට සහ කාර්යක්ෂමව කළමනාකරණය කිරීම පිළිබඳ පළපුරුද්දක් සහිත විය යුතුය.

**(ඇ) රාජ්‍ය සේවයේ නිලධාරීන් සඳහා :**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙහි බලතල, රාජකාරි සහ කාර්යයන් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමු වන පංතිය හා ඊට ඉහළ නිලධාරීන් ද්විතියන පදනම මත අධ්‍යක්ෂ ජනරාල් ලෙස පත් කිරීමට හැකි හෙයින් ඉල්ලුම් කළ හැක.

වැටුප් පරිමාණය (HM 2-2) :

රු. 93,020/- 12 X 2,700 = රු. 125,420/- (මාසික) සහ රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.

**වෙනත් සුදුසුකම්**

- සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
- දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් හෙබි විය යුතුය.

**ඉහත තනතුර සඳහා හිමි වෙනත් ප්‍රතිලාභ :**

- 2016.10.27 දිනැති PED 1/2015 (i) චක්‍රලේඛය අනුව වාහනයක් ලබා දෙනු ලැබේ.
- අපනයන සංවර්ධන මණ්ඩලයීය වෛද්‍යාධාර යෝජනා ක්‍රමයක්.
- රජය අනුමත සහන පොලී ප්‍රමාණයන් යටතේ නිවාස ණය හා ආපදා ණය
- ලබා නොගත් වෛද්‍ය නිවාඩු මූල්‍යකරණය සහ වාර්ෂික ප්‍රසාද දීමනා (රජයේ චක්‍රලේඛවලට අනුකූලව)
- සේවක අර්ථසාධක අරමුදල - සේවකයාගෙන් 10%, ආයතනයෙන් 15% සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල - ආයතනයෙන් 3%

**අයදුම් කිරීමේ පිළිවෙල :**

ඔබ ඉහත සුදුසුකම් සපුරා ඇත්නම්, අපනයන සංවර්ධන මණ්ඩලයේ 08 වන මහලේ පිහිටි මානව සම්පත් කළමනාකරණ අංශයෙන් හෝ www.srilankabusiness.com වෙබ් අඩවියෙන් ලබාගත් ("Announcements" කාණ්ඩය යටතේ) EDB ආකෘතියට අනුව සකස් කරන ලද අයදුම්පතක් **2024.03.18** දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත දක්වා ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමඟ අදාළ සියලුම අධ්‍යාපන හා පළපුරුද්ද සනාථ කරන සහතික පත්‍රවල පිටපත් අමුණා එවිය යුතුය.

අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුරු නාමය සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත්, අදාළ සියලුම සහතික පත්‍රවල පිටපත් අමුණා නොමැති හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

රාජ්‍ය අංශයේ සේවකයන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුයි. එම අයදුම්පතේ අමතර පිටපතක් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර සභාපති / ප්‍රධාන විධායක නිලධාරී වෙත එවන මෙන් අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 02/2020 දරන 2020.10.26 දිනැති චක්‍රලේඛයට අනුව අනුමත තනතුරුවල පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ වගකීම ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශ ලේකම් සතුය.

**සභාපති / ප්‍රධාන විධායක නිලධාරී,**
**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,**
**NDB – EDB ටවර්, අංක 42, නවම් මාවත,**
**කොළඹ 02**
**දුර : 011-2300700**